2025 අය-වැය පක්ෂ විපක්ෂ අදහස්

රනිල්ගේ අය-වැයේ දිගුවක්

එජාප සභාපති වජිර අබේවර්ධන

මෙවර ඉදිරිපත් කර ඇති අය - වැය හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ඉදිරිපත් කළ අය - වැයේ දිගුවක් බව එක්සත් ජාතික පක්ෂ සභාපති, හිටපු අමාත්‍ය වජිර අබේවර්ධන මහතා පැවසීය. අය - වැය සම්බන්ධයෙන් ඊයේ (18) මාධ්‍ය වෙත අදහස් දක්වමින් ඒ මහතා මේ බව සඳහන් කළේය.

වජිර අබේවර්ධන මහතා මෙසේ ද කීය.

"මාලිමා රජය ඉදිරිපත් කර තිබෙන යෝජනා බොහෝමයක් හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා 2023, 2024 වර්ෂවල ඉදිරිපත් කළ අය - වැයවල තිබුණු යෝජනායි. මාලිමා රජයේ අලුත් යෝජනාවකට ඇත්තේ 'ක්ලීන් ශ්‍රී ලංකා' විතරයි. ඒ සඳහා මිලියන 5000ක් පමණ වෙන් කර තිබෙනවා.

මූලික වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ එකඟතාවන්ට අනුව මේ අය - වැය ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව බැලූ විට රනිල් වික්‍රමසිංහ මහතා ඉදිරිපත් කළ අය - වැයවලම දිගුවක් පමණයි තිබෙන්නේ. වෙන කිසිදු අලුත් දෙයක් නැහැ.

උදාහරණයක් ලෙස ගත්තම අප අස්වැසුමට මිලියන 189ක් වෙන් කර තිබුණා. මෙවර අය - වැයෙන් එයට මිලියන 232ක් දාලා තිබෙනවා. අලුත් වැඩසටහනක් නැහැ.

මහපොළ ශිෂ්‍යත්වයට පොඩි ගාණක් වැඩි කරලා. කොහොමත් වරින් වර විවිධ ආණ්ඩු මහපොළ වැඩි කර තිබෙනවා. මාලිමා රජයත් කීයක් හරි දැම්මා. ඒකයි වුණේ.

ළදරු පාසල්වලට අපේ ආණ්ඩු කාලයෙත් ප්‍රතිපාදන වැඩි කළා.

මාලිමා රජයත් රුපියල් 1000ක් විතර වැඩි කර තිබෙනවා.

වකුගඩු රෝගීන්ට අපිත් ගාණක් වැඩි කළා. මාලිමා රජයත් ගාණක් වැඩි කරලා.

රැකියාවලට බඳවා ගැනීමේ දී එක එක්කෙනාගේ ලැයිස්තුවලට ගන්නේ නෑ, පාරදෘශ්‍ය ක්‍රමයකට බඳවා ගන්න බව පැවසුවා. ඒක හොඳ යෝජනාවක්.

"සිරකරුවෝ ද මනුෂ්‍යයෝය" යථාර්ථයක් කළ අය-වැයක්

සිරකරු අයිතිවාසිකම් සුරැකීමේ කමිටුවේ විධායක අධ්‍යක්ෂ නීතිඥ සේනක පෙරේරා

බුද්ධිකා ඉඹුලාන

සිරකරුවන්ගේ වෘත්තීය නිපුණතාව වැඩිදියුණු කර ඔවුන් මේ රටේ වැඩදායක පුරවැසියන් බවට පත් කිරීමටත් ඒ තුළින් බන්ධනාගාර තුළ පවතින තදබදය නැති කිරීමටත් මෙවර අයවැය තුළින් යෝජනා වීම අගය කරන බව සිරකරු අයිතිවාසිකම් සුරැකීමේ කමිටුවේ විධායක අධ්‍යක්ෂ නීතිඥ සේනක පෙරේරා පවසයි. ශ්‍රී ලංකාවේ බන්ධනාගාර පද්ධතිය පුරාම රඳවා සිටින 30,000ක් පමණ වන සිරකරුවන් රටේ ආර්ථිකයේ කොටස්කරුවන් බවට පත් කිරීම ඔවුන්ට මෙන්ම දියුණු වෙමින් පවතින අප රටට ද ඉතාමත් වැඩදායක කටයුත්තක් බව ද ඒ මහතා පෙන්වා දෙයි.

පෙරේදා (17) ඉදිරිපත් කළ 2025 වසර සඳහා වූ අය වැය පිළිබඳව අදහස් දැක්වූ නීතිඥ සේනක පෙරේරා මහතා අවධාරණය කරන්නේ, සිරකරු අයිතිවාසිකම් සුරැකීමේ කමිටුව ලෙස වසර ගණනාවක සිට සිරකරුවන්ගේ සුබසිද්ධිය සඳහා කටයුතු කරමින් සිටින තම සංවිධානය මෙවර අයවැය යෝජනා සම්බන්ධයෙන් සතුටට පත් වන බවයි.

පසුගිය කාලයේ සිරකරුවන්ගේ ශ්‍රමය සූරාකන ආකාරයේ වැඩසටහන් පැවතියේ පුද්ගල ලාභය වැඩිදියුණු කරගැනීමේ අරමුණෙනි. එමෙන්ම පසුගිය වසරවල විධිමත් පුනරුත්ථාපන වැඩ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් බන්ධනාගාරවලින් නිදහස් වන පුද්ගලයන් නැවත නැවතත් බන්ධනාගාරගත වීමේ ප්‍රතිශතය 50% දක්වා ඉහළ ගොස් තිබුණි.

සාම්ප්‍රදායික රැකියා වෙළෙඳපොළ වෙනුවට රැකියා ඉල්ලුමට සරිලන වෘත්තීය නිපුණතාවක් ලබාගත හැකි 65%ක පමණ සිරකරුවන් පිරිසකට සෙත සැලසීමට මෙවර අය වැයෙන් මිලියන 100ක මුදලක් වෙන්කර තිබේ. 'සිරකරුවෝ ද මනුෂ්‍යයෝය' යන්න මහ පොළොවේ යථාර්ථයක් බවට පත් කිරීමේ කටයුත්තේම කොටසක් ලෙස එය හැඳින්විය හැකියි.

වාමාංශික රන් ආලේපිත දක්ෂිණාංශික අය-වැයක්

සජබ මන්ත්‍රී එස්.එම්. මරික්කාර්

රක්ෂණ ශ්‍රියන්ත

වර්තමාන ආණ්ඩුවේ අලුත් අය-වැය වාමාංශික රන් ආලේපිත, දක්ෂිණාංශික අයවැයක් ලෙස පෙනෙන බව සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. එම්. මරික්කාර් මහතා ප්‍රකාශ කළේය.

සමගි ජන බලවේගය ප්‍රධාන කාර්යාලයේ ඊයේ (18) පැවැති මාධ්‍ය හමුවට සහභාගි වෙමින් පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. එම්. මරික්කාර් මහතා මේ බව සඳහන් කළේය.

ඒ මහතා වැඩිදුරටත් මෙසේ පැවැසීය,

"වර්තමාන ආණ්ඩුව ඉදිරිපත් කළ අය-වැය ඉදිරිපත් කරන විට රාජ්‍ය සේවකයන්ගේ අවම මූලික වැටුප රුපියල් 15,000ක් වැනි මුදලකින් වැඩි කරන බව ජනාධිපතිවරයා ප්‍රකාශ කළා.

රුපියල් 24,750ක් මූලික වැටුපක් ගන්න පුද්ගලයකුට මේ වනවිට රුපියල් 2500ක දීමනාවක්, රුපියල් 5000ක සහ තවත් රුපියල් 17,000ක පමණ දීමනා සමඟ ලැබෙනවා. දළ වශයෙන් රුපියල් 49,000කට ආසන්න ප්‍රමාණයක වැටුපක් රජයේ සේවකයකු ලබා ගන්නවා.

වර්තමාන ආණ්ඩුව ඉදිරිපත් කළ අය වැය තුළින් රුපියල් 5000ක සහ රුපියල් 2500ක දීමනාව කපා දමා තිබෙනවා. ඉතිරි වෙලා තිබෙන්නේ රුපියල් 17,000ක දීමනාව පමණයි.

රුපියල් 8250ක් තමයි වසර තුනටම රාජ්‍ය සේවකයකුට ලැබෙන්නේ. මේ වසර තුළ ලැබෙන්නේ රුපියල් 5975ක මුදලක්. රුපියල් 5000ක් සහ ඉතුරු රුපියල් 3250 සියයට 30ක දීමනාවක් තමයි ලැබෙන්නේ.

ලබන අවුරුද්දේ දී වැටුපට රුපියල් 2000කට ආසන්න ප්‍රමාණයක් එකතු වීමට නියමිතයි. ජාතික ජන බලවේගයේ කතාවලට රාජ්‍ය සේවකයන් රැවටුණ බව තේරුම් යන්නේ අප්‍රේල් මාසයේ 8 වැනිදා පඩි ලබන කොටයි. ඒ වගේම රාජ්‍ය සේවකයන් සිතාගෙන ඉන්නේ රුපියල් 15,000කින් වැටුප් වැඩි කරනවා කියලා. නමුත් ඇත්ත වශයෙන්ම මේ අවුරුද්දේ වැඩි වෙන්නේ රුපියල් 5975ක මුදලක්. ඒ වගේම මැතිවරණ වේදිකාවේ දී ජනාධිපතිවරයා ප්‍රකාශ කළා ආහාර සඳහා, සෞඛ්‍ය සඳහා, පාසල් උපකරණ සඳහා අය කළ බදු ජාතික ජන බලවේග රජයකින් ගෙන එන පළමු අය වැයෙන්ම අඩු කරනවා කියලා. නමුත් ජාතික ජන බලවේගයේ පළමු අය වැයෙන් ඒ කිසිවක බද්ද අඩු වෙලා නෑ.

විපක්ෂයට දැන් බිල්ලො මවන්න බෑ

කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති

නෙරංජලා වික්‍රමසිංහ

වත්මන් අය වැය විපක්ෂය හිතාගෙන සිටි අය වැයක් නොවූවත් පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ඇතුළත් අයවැයක් බව කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති මහතා පැවසීය.

අය වැය සම්බන්ධයෙන් ඊයේ (18) මාධ්‍ය හමුවේ අදහස් දක්වමින් ඒ මහතා සඳහන් කළේ විපක්ෂය ජාතික ජන බලවේගය ගැන මවන්නට උත්සාහ කළ බිල්ලා මවන්න දැන් විපක්ෂයට නොහැකි වී ඇති බවයි.

අය වැය සම්බන්ධයෙන් වැඩිදුරටත් අදහස් දැක් වූ ඒ මහතා මෙසේ ද කීය.

මේ අය වැය විපක්ෂය හිතාගෙන හිටපු නැති අයවැයක්. විපක්ෂය කියන්නේ රට අනුරට නෙවෙයි රට අයි එම් එෆ් එකට දාපු අයවැයක් කියලා. මේ පැත්තෙන් රනිල්ගේ පුටුවට දීපු අය වැය පුටුව හරවලා අනිත් පැත්තෙන් අනුරට දුන්නා කියනවා. වාමාංශික අය වැයක් නෙවෙයි කියනවා. වාමාංශික ආණ්ඩුවකින් ඒගොල්ලෝ බලාපොරොත්තු වූ දේ මොකක් ද කියලා අපි අහනවා. අපි ගැන විපක්ෂය රටට කියපු දේවල් මේ අය වැයේ නැහැ. ඒකයි ප්‍රශ්නය.

පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අපි ගැන අපි කිව්ව දේවල් මේ අය වැයේ තියෙනවා. හැබැයි හර්ෂලා, සජිත්ලා, රනිල් වික්‍රමසිංහලා කියපුවා මේ අය වැයේ නැහැ. ඔන්න ඔතනයි මේ පරස්පරය තියෙන්නේ.

විපක්ෂය බලාපොරොත්තු වුණේ අපේ ආණ්ඩුවක් ආවට පස්සේ ජනතාව සාගතයේ බඩගින්නේ ඉඳියි කියලා. ලෝකේ වෙන රටවල් එක්ක ගනුදෙනු කරන්නේ නැහැ කියලා. ඒගොල්ලෝ හිතාගෙන ඉන්නවා ඒකයි වාමාංශික ආණ්ඩුව කියලා. මේ අය හිතාගෙන ඉන්නේ අපි ඇවිල්ලා ලංකාව පොල් කට්ටකින් වහනවා කියලා. එයාලා තමයි නිව්ලිබරල්, ධනවාදී, ලෝකෙත් එක්ක ගනුදෙනු කරන, විවෘත ආර්ථිකය තියෙන, ආයෝජකයන්ට එන්න දෙන, පෞද්ගලික අංශයත් එක්ක ගනුදෙනු කරන, ඉංග්‍රීසියෙන් කතා කරන, කෝට් අඳින ආණ්ඩුව කියලයි මේ අය හිතන් ඉන්නේ. අපි නිකන් කන්නේ බොන්නේ නැති ගාණට දාලා එහෙම ඉන්න වෙයි කියලයි මේ අය හිතුවේ.

විපක්ෂය ජනතාවට මවන්න හදපු කළු චිත්‍රය ජනාධිපති අනුර කුමාර දිසානායකට හෝ මේ ආණ්ඩුවට ඇත්තටම නැහැ.

ලෝකය සහ රට අපේ ප්‍රතිපත්තිය මත පිහිටපු පළමු අය වැයයි මේ දැක්කේ. විපක්ෂය ජාතික ජන බලවේගය ගැන මවන්න හදපු බිල්ලා මවන්න දැන් විපක්ෂයට බැහැ.

IMF ප්‍රතිපත්ති රාමුවේ අය-වැයක්

හිටපු මුදල් රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ

ආර්ථික වර්ධනය 5%ක් දක්වා රට මෙහෙයවීමේ සැබෑ හිමිකරුවන් වනුයේ හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සහ පැවති රජය බව හිටපු මුදල් රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මහතා පැවසීය.

අය - වැය සම්බන්ධයෙන් මාධ්‍ය වෙත ඊයේ (18) අදහස් දක්වමින් ඒ මහතා මේ බව සඳහන් කළේය.

සේමසිංහ මහතා මෙසේ ද කීය.

"නව ලිබරල් ආර්ථික වැඩපිළිවෙළ තවදුරටත් ඉදිරියට ගෙන යෑමට ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා සිය මංගල අය - වැයෙන් ගත් ප්‍රවේශය අගය කරනවා. මාලිමාව අප රට ආර්ථික වශයෙන් ගොඩ නැඟීමට තිබූ ස්වර්ණමය අවස්ථා කඩාකප්පල් කරමින් ගෙන ගිය වෛරී, කුහක දේශපාලන ප්‍රතිපත්ති වෙනුවට නව ලිබරල් ප්‍රතිසංස්කරණ ප්‍රමුඛ කරගත් ආර්ථික වැඩපිළිවෙළක් සහිත අය - වැයක් ඉදිරිපත් කර තිබෙනවා.

මෙය සම්පූර්ණයෙන්ම ජාත්‍යන්තර අරමුදලේ ප්‍රතිපත්ති රාමුව තුළ ඉදිරිපත් කළ අය - වැයක්. එසේම රනිල් වික්‍රමසිංහ මහතාගේ හා අපගේ පැවති රජයේ ප්‍රතිසංස්කරණ හා ප්‍රතිපත්තිවල නොවෙනස් දිගුවක්.

රටේ ආර්ථික වර්ධනය 5%ක් බව ජනාධිපතිවරයා පැවසුවත් එම කඩඉම දක්වා මෙහෙය වූ සැබෑ හිමිකරුවන් වන්නේ අප රජයයි. එමෙන්ම එය 2022දී 7.8%ක ආර්ථිකය සංකෝචනයේ සිට 5%ක වර්ධනයක් දක්වා ගමන් මඟ අමතක කළ නොහැකියි. ඒ දක්වා පැමිණීමේ දී වර්තමාන ජනාධිපතිවරයා ඇතුළු කණ්ඩායම විපක්ෂයේ සිට සිදු කළේ අකුල් හෙළීම පමණයි.

ජනතාවාදී ආණ්ඩුවක් බව තහවුරු වෙනවා

ජාතික භික්ෂු පෙරමුණේ ප්‍රධාන ලේකම් වකමුල්ලේ උදිත හිමි

නෙරංජලා වික්‍රමසිංහ

මෙවර අය - වැය තුළින් වත්මන් ආණ්ඩුව ජනතාවාදී ආණ්ඩුවක් බව තහවුරු වන බව ජාතික භික්ෂු පෙරමුණේ ප්‍රධාන ලේකම් වකමුල්ලේ උදිත හිමි පැවසූහ.

අය - වැය සම්බන්ධයෙන් ඊයේ (18) පැවති විශේෂ මාධ්‍ය හමුවක දී උන්වහන්සේ මේ බව සඳහන් කළහ.

එහිදී වැඩිදුරටත් අදහස් දැක් වූ වකමුල්ලේ උදිත හිමියෝ මෙසේ ද කීහ.

" ජාතික ජන බලවේගයේ ආණ්ඩුව මහජන ආණ්ඩුවක්. මහජනතාවගේ වුවමනාවට මහජනතාවගේ අවශ්‍යතාවට මහජනතාව විසින් පත්කර ගත්ත ආණ්ඩුවක්. මහජන නියෝජිතයෝ ඉන්න මහජන ආණ්ඩුවක්.

මීට පෙරත් ආණ්ඩු තිබුණා. නියෝජිතයොත් මහජනතාව පත්කළා. නමුත් වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මහජන ආණ්ඩුවක් කියලා කියන්න පුළුවන් කමක් තිබුණේ නැහැ.

ජනාධිපතිවරයා ඇතුළු කොට ඇති කැබිනට් මණ්ඩලය සහිත ජාතික ජන බලවේගයේ ආණ්ඩුව වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ජනතාවාදී ආණ්ඩුවක් කියලා කියන්න පුළුවන්. මහජන ආණ්ඩුවක් කියන්න තහවුරු කරන තවත් සාධකයක් ලෙස ජනාධිපතිතුමා ඉදිරිපත් කළ අය - වැය පෙන්වා දෙන්න පුළුවන්.

ඒ අය - වැය මහජන ආණ්ඩුවක මහජනයා ඉලක්ක කරගත් අය - වැයක් බව දුෂ්ට චේතනාවෙන් තොර කුහක මානසිකත්වයෙන් තොර පුද්ගලයන්ට විවෘත මනසකින් දැකලා ප්‍රකාශ කරන්න පුළුවන්.

අය - වැය මූලධර්මවලට අනුව කර්මාන්ත සේවා හා කෘෂිකර්ම අංශවල වර්ධනය එම නිෂ්පාදන සඳහා මහජනතාවගේ සක්‍රිය දායකත්වය සහ සහභාගීත්වය සිදුවිය යුතු වීම, නිෂ්පාදනයෙන් ලැබෙන ප්‍රතිලාභ සමාජය පුරා සාධාරණව බෙදී යෑම, කියන මූලධර්ම 3ක් දක්වා තිබෙනවා.

වර්තමාන ආණ්ඩුව ජනතාවගෙන් බලය ඉල්ලීමේ දී මේ රටේ ජනතාවාදී ආණ්ඩුවක් ගොඩනඟන්න බලාපොරොත්තු වෙන බව කීවා. නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනඟන බවත් කීවා. ඒ නිෂ්පාදන ආර්ථිකයට මහජනතාව සම්බන්ධ කරගන්නා බවත් කීවා. ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවට සාධාරණ ලෙස බෙදී යන ආකාරයේ ක්‍රමයක් සකස් කරන බවත් කීවා.

අන්න ඒ මැතිවරණයට පෙර කරන ලද ප්‍රකාශ වත්මන් අය - වැය තුළින් ඉතා හොඳින් ප්‍රකට කර තියෙනවා. ඒක භාවිතාවට නගන්න වර්තමාන ආණ්ඩුව කටයුතු කළ යුතුයි. ඒක කාටවත් නැහැයි කියන්න බැහැ. මේ අය - වැය ඉතාම ජනහිතකාමී අය - වැයක් කියලා අපට නොබියව කියන්න පුළුවන්.

පොහොසත් රටක් ලස්සන ජීවිතයක් තේමාව අනුව මේ අය - වැය පෙළ ගැසිලා තියෙනවා. ජනතාව ඇති හැකි භාවයට පත් කිරීම ආණ්ඩුවක වගකීමයි. ජනතාව ඇති හැකි අය පත් බවට පත් කිරීමේ ක්‍රමවේදයක් ආණ්ඩුවකට තිබිය යුතුයි.

මීට පෙරත් පත්වුණු ආණ්ඩු වචන තොරොන්බල් කළා. නැති බැරි අය ඇති හැකි අය කරනවා කිව්වා. ඒ ආණ්ඩුවල නියෝජිතයන්ගේ සහයෝගයෙන් නැති බැරි අයට නැත්තටම නැතුව ගියා. ඇති හැකි අයට තවත් හැකි වුණා.

සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වෙලා

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වසන්ත අතුකෝරාළ

අසේල කුරුළුවංශ

පසුගිය රජයන්ට වඩා වෙනස් ක්‍රමවේදයක් ඔස්සේ ආර්ථිකයේ හා සමාජයේ සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි නව රජයේ මංගල අය - වැය පිළියෙල කර තිබෙන බව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන විද්‍යා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වසන්ත අතුකෝරාළ මහතා පවසයි.

මෙයට පෙර බලයේ සිටි ආණ්ඩු ඉදිරිපත් කළ අය - වැය වාර්තා සලකා බැලීමේ දී ආර්ථිකය හා සමාජය කෙරෙහි පුළුල් දැක්මක් නොමැතිව සමාජයේ එක් එක් කණ්ඩායම් ඉලක්ක කර යම් ආකාරයක සහනාධාර වැඩපිළිවෙළක් ඉදිරිපත් කළ බවක් පෙනෙන්නට තිබුණ ද මෙම අය - වැය තුළ එවැන්නක් දක්නට නොමැති බව ද ඒ මහතා කීය.

ජාතික ජනබලවේගය බලයට පත්ව ඉදිරිපත් කළ මංගල අය - වැය සම්බන්ධයෙන් මාධ්‍ය හමුවේ කරුණු දක්වමින් මහාචාර්ය වසන්ත අතුකෝරාළ මහතා මෙසේ ද පැවසුවේය.

සමාජයේ හා ආර්ථිකයේ සෑම ක්ෂේත්‍රයක්ම පුළුල්ව ආවරණය කිරීමට ගත් උත්සාහයක් මෙම අය - වැය තුළ දක්නට ලැබෙනවා.

අධ්‍යාපන, සෞඛ්‍ය, ප්‍රවාහන වැනි ක්ෂේත්‍ර සම්බන්ධව විශේෂ අවධානයක් මෙමඟින් යොමුකර තිබෙනවා. මේ ක්ෂේත්‍රවල කාලයක් තිස්සේ පැවැති ව්‍යුහාත්මක ගැටලු නිවැරදිව තේරුම් ගෙන ඒවාට යම් ආකාරයකට විසඳුම් ලබා දීමට උත්සාහ කිරීමක් අය - වැය තුළ දැකිය හැකියි.

ඒ වගේම වාරිමාර්ග පද්ධතිය දියුණු කිරීම, කෘෂිකර්මාන්තය නඟාසිටුවීම, ග්‍රාමීය ජන දිවිය ක්‍රමවත්ව ගොඩනැඟීම සම්බන්ධව මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්, පෞද්ගලික හා රාජ්‍ය අංශයේ වැඩ කරන ජනතාව, විශ්‍රාමිකයන් ඇතුළු සෑම ජන කොටසක්ම ආවරණය වන පරිදි මෙය විශ්ලේෂණාත්මකව පිළියෙල කර තිබෙනවා.

මීට වඩා ආර්ථික විද්‍යාත්මකව වඩා නිර්මාණශීලි කරුණු ඇතුළත් කර සකස් කළා නම් මේ අය - වැය තවත් සුබවාදී වෙන්න තිබුණා.

රජය පෞද්ගලික අංශයෙන් වෙන්කර තබාගැනීමේ ප්‍රයත්නයක් මේ තුළ යම් ප්‍රමාණයකට දැකිය හැකියි. ඒ අතරම රජය හා පෞද්ගලික අංශය ඒකාබද්ධව කරන වැඩ ගැනත් මෙහි කියවෙනවා.

වැටුප් වැඩි කරගැනීමට තිබූ බලාපොරොත්තු සුනු විසුනු කර දැම්මා

රජයේ වෘත්තිය සමිති සම්මේලනය

නෙරංජලා වික්‍රමසිංහ

වැටුප් වැඩි කර ගැනීමට රාජ්‍ය සේවකයන්ගේ තිබූ බලාපොරොත්තු මෙවර අය වැයෙන් සුනු විසුනු කර දැමීම කිසිදු අයුරකින් අනුමත නොකරන බව රාජ්‍ය, පළාත් රාජ්‍ය, රජයේ වෘත්තිය සමිති සම්මේලනය අවධාරණය කරයි.

ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා වෙත ලිපියක් යොමු කරන රාජ්‍යය, පළාත් රාජ්‍යය, රජයේ වෘත්තිය සමිති සම්මේලනයේ ප්‍රධාන ලේකම් අජිත් කේ. තිලකරත්න මහතා පෙන්වා දෙන්නේ රාජ්‍ය සේවකයන්ගේ අවම වැටුප සංශෝධනය කරලීමත් සමස්ත රාජ්‍ය සේවකයන් වැටුප් වැඩි කරලීමත් සිදු කිරීමට රජය කටයුතු කළ යුතු බවයි. රාජ්‍ය බලය ලබා ගැනීමට පෙර රාජ්‍ය සේවකයන් සඳහා මාස 6න් 6ට වැටුප් වැඩි කරලීමටත් ජීවන වියදම් දීමාව රුපියල් 20,000කින් වැඩි කරලීමටත් ලබාදුන් පොරොන්දු ඉටු කරන තෙක් අපේක්ෂා සහගතව බලා සිටි සමස්ත රාජ්‍ය සේවකයන්ට මෙවර අය වැයේදී අත්විඳින්නට සිදු වූයේ අම්හිරි අත්දැකීමකි.

මෙවර ප්‍රකාශයට පත් කරන ලද අය වැය මඟින් රාජ්‍ය සේවකයන්ට විශාල වැටුප් වැඩි වීමක් ලබාදෙන බව පෙන්වා දුන්න ද එම වැඩි වන වැටුප ලබා ගැනීමට 2027 වර්ෂය තෙක් බලා සිටීමට සිදුවීම කනගාටුවට කරුණකි. ඒ අනුව ප්‍රාථමික ශිල්පීය නොවන සේවයේ රාජ්‍ය සේවකයකුට හිමිවන රුපියල් 15,750ක අවම වැටුප් වැඩි වීම අනුව මෙම වැටුප් වැඩි වීම ගණනය කර බැලීමේදී දැනට ගෙවීම් කරන 7500 දීමනාව එම ඒකාබද්ධ වැටුපට එකතු කරලීමක් සිදු කළ විට සැබෑ ලෙස වැඩි වන වැටුප් වැඩි වීම රුපියල් 8250කි.

එම රුපියල් 8250 වැටුප් වැඩි වීම 2025 වර්ෂයේ දී 5975ක් වශයෙන් ද 2026 වසරේදී 1137ක් වශයෙන් ද 2027 වර්ෂයේ දී රුපියල් 1137ක් වශයෙන් ද ලබාදීම සිදුවනු ඇත.

මෙලෙස වැටුප් වැඩි කර ගැනීමට රාජ්‍ය සේවකයන්ගේ තිබූ බලාපොරොත්තු සුනු විසුනු කර දැමීම කිසිදු අයුරකින් අනුමත නොකරන අතර මෙලෙස ලබාදුන් පොරොන්දු වචනයට පමණක් සීමා කිරීම තුළ ඔබ කෙරෙහි තබා ඇති විශ්වාසය පළුදුවීම කිසි අයුරකින් නවතාලිය නොහැකියි.

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
National Lotteries Board
සඳුදා 2025.02.17
නිල ප්‍රතිඵල www.nlb.lk
මහජන සම්පත
දිනුම් වාරය: 5750
මිළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 28,884,764.00
ජයග්‍රාහී අක්ෂරය H ජයග්‍රාහී අංක 1 4 3 4 8 5
අද සම්පත දිනුම් වාරය 325
H 3 4 8 5
ජයග්‍රාහී අක්ෂරය ජයග්‍රාහී අංක
ගොවි සෙත
දිනුම් වාරය 3992 දිනය 2025.02.17 මිළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 80,293,350.84
ජයග්‍රාහී ඉංග්‍රීසි අක්ෂරය E ජයග්‍රාහී අංක 02 06 22 41 විශේෂ අක්ෂරය E
Mega POWER
දිනුම් වාරය 2098 දිනය 2025.02.17 මිළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 462,395,318.00
මිළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00
මිළඟ සුපර් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00
ලාංඡන අකුර O සුපර් අංකය 08 ජයග්‍රාහී අංක 03 32 33 80
NLB ජය ජය JAYA
දිනය 2025.02.17 දිනුම් වාරය 0018
ජයග්‍රාහී අක්ෂරය F ජයග්‍රාහී අංක 1 0 7 6
හදන
දිනය 2025.02.17 දිනුම් වාරය 1059 මිළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 3,731,989.48
ජයග්‍රාහී ලාංඡනය කටක ජයග්‍රාහී අංක 04 12 44 46 ධනසෝග අංකය 88135 දවස් සෙවු අංකය 17
ධන නිධානය
දිනුම් වාරය 1780 2025.02.17 මිළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය Rs.85,612,464.32
ජයග්‍රාහී ඉංග්‍රීසි අක්ෂරය S ජයග්‍රාහී අංක 02 08 22 38 විශේෂ අක්ෂරය S ජයග්‍රාහී ලක්ෂපති බබල් චාන්ස් අංකය 04051